**කුරුණෑගල ප්‍රාදේශීය සභාව 2021**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද 1.6.1 (අ) ඡේදයේ නිර්දේශයන් හැර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයේ දී ගණකාධිකරණ අඩුපාඩු යටතේ දක්වා තිබූ ගොඩනැගිලි 06 ක ප්‍රාග්ධන වියදම් රු.6,051,334 ක් ප්‍රාග්ධනිත නොකිරීම සමාලෝචිත වර්ෂයේ දී නිවැරදි කර නොතිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල ගොඩනැගිලිවල සංවර්ධනයට දරා තිබුණු රු.33,525,755 ක් හා උපකරණ මිලදී ගැනීම් රු.5,618,844 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු රු.49,113,750 ක් වටිනා ඉඩම් 13ක් හා වටිනාකම හඳුනානොගත් ඉඩම් 09ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය මඟින් නිවැරදි කරන බව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කර නොතිබුණු රු.17,029,606 ක් වටිනා සංවර්ධන ව්‍යාපෘති 13 ක් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ප්‍රාග්ධන වියදම් හා කර්මාන්ත ණයහිමියෝ එම ප්‍රමාණයෙන් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදල් ණය ශේෂය රු.4,388,051 ක් වුවත්, රු.5,501,093ක් ලෙස රු.1,113,042 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | |

| | | |
|---|---|---|
| (ඊ) සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 03 ක ආදායම රු.36,239,357 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.<br>(උ) සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 06 ක රු.2,843,998 ක මුදලක් අඩුවෙන් හා ප්‍රවාහන සම්බන්ධතා හා වෙනත් සේවා වියදම රු.177,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.<br>(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.813,853 ක් වුවද, ගිණුමෙහි රු.477,458 ක් ලෙස රු.336,395 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය මඟින් නිවැරදි කරන බව දන්වා සිටිමි. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

**1.6.2 අසම්භාව්‍ය වත්කම් හා බැරකම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව විසින් බාහිර පාර්ශවයන් 02 කට නඩු පවරා ඒ වෙනුවෙන් රු.55,195 ක නඩු ගාස්තු ගෙවා තිබූ අතර, සභාවට එරෙහිව බාහිර පාර්ශවයන් 04 දෙනෙක් පැවරූ නඩු වෙනුවෙන් රු.494,140 ක් වැයකර තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | නීතිඥ ගාස්තු වියදම් වෙනත් සේවා යටතේ දක්වා ඇත. | අසම්භාව්‍ය වත්කම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතු වේ. |

**1.6.3 අවිනිශ්චිත ගිණුම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.291,909 ක හර ශේෂයක් සහිත අවිනිශ්චිත ගිණුමක් ද දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. | අවිනිශ්චිත ගිණුම සොයා බලා නිවැරදි කළ යුතු වේ. |

**1.7** **අනුකූල නොවීම්**

**-------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**--------------------------------------------------------------------------------**

| | නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 126 (ඊ) වගන්තිය | සභා බල ප්‍රදේශය තුල සවිකර ඇති දැන්වීම් පුවරු 6 කින් රු.385,000 ක මුදලක් අයකර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි සභා බලප්‍රදේශය තුළ සවිකර ඇති දැන්වීම් පුවරු 06 කින් ගාස්තු අය කර නොමැත. | සියළු දැන්වීම් පුවරු වර්ෂය මුල සමීක්ෂණය කර ගාස්තු අයකළ යුතු වේ. |
| (ආ) | 2015 වර්ෂයේ නොවැම්බර් 02 දිනැති අංක 2015/01 දරන වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 03 (V) උප වගන්තිය | වෛද්‍ය ආධාර සඳහා වූ උපරිම වැය සීමාව රු.25,000 ක් වුවද එම සීමාව ඉක්මවා පුද්ගලයන් 02 කට රු.1,068,928 ක ආධාර ලබාදී තිබුණි. | මුදල් කමිටු අනුමැතිය හා ගරු ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය මත ආධාර මුදල් ලබා දී ඇත. | චක්‍රලේඛ උපදෙස්වල දක්වා ඇති සීමා අනුව කටයුතු කළ යුතු වේ. |
| | 3(I) උප වගන්තිය | විහාරස්ථානයක ඉදිකිරීම් සඳහා ආධාර ලබාදිය හැකි උපරිම සීමාව රු.20,000 ක් වුවත් එම සීමාව ඉක්මවා රු.500,000 ක් ආධාර ලබාදී තිබුණි. ආධාර මුදල් ලබාදීමට ප්‍රථම සභාවේ තාක්ෂණික නිලධාරී විසින් ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණ අතර, ආධාර ලබාදීමෙන් පසු අදාල කර්තව්‍ය නිසි පරිදි ඉටුකර ඇද්දැයි අධීක්ෂණයන්ද සිදුකර නොතිබුණි. | විගණනය පෙන්වා දෙන ආකාරයට කාර්මික නිලධාරි වාර්තාවක් ලබාගෙන එම අධීක්ෂණය යටතේ ආධාර ලබාදීමට කටයුතු කර ඇති බව දන්වමි. | චක්‍රලේඛ සීමාව අභිබවා ආධාර ලබා නොදිය යුතු අතර ආධාර ලබාදුන් පසු අදාල කාර්යය ඉටුකළ බවට පසු විපරමක් සිදුකළ යුතු වේ. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**---------------------**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.153,025,836 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 147,319,946 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

## 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් ඒකක 8,981 කින් රු.9,503,995 ක මුදලක් අයකර නොතිබුණි | ඉදිරියේ දී හිඟ ආදායම් අය කර ගැනීම සඳහා තවදුරටත් ක්‍රියා කරන බව විගණනය වෙත දන්වා සිටිමි. | හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග යොදාගෙන හිඟ ආදායම් අයකර ගත යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හෙල්ගමවත්ත වෙන්දේසියෙන් පොදු කටයුතු සඳහා අක්කර 03 රූඩ් 2 පර්චස් 20.1 ඉඩම් ප්‍රමාණයක් ලැබිය යුතුව තිබුණද පොදු කටයුතු සඳහා ලබා දී තිබූ ඉඩම් ප්‍රමාණය වටා කම්බි වැටක් ගසා ආරක්ෂාව තහවුරු වන ආකාරයට වෙන්කර නොතිබුණි. මෙම ඉඩමේ සියළු සංවර්ධන කටයුතු එනම් මාර්ග, කාණු හා බෝක්කු ඉදිකිරීම් සිදුකර කට්ටි සැලැස්ම සඳහා අනුමැතිය ලබාගත යුතු වුවත්, එම කටයුතු සිදු නොකර ඉඩම් කොටස් විකුණමින් පවතින බව විගණනයට නිරීක්ෂණය විය. | මෙම සභාබල ප්‍රදේශයේ බමුණාවල ග්‍රාම නිලධාරී වසම නාගරික සංවර්ධන අධිකාරිය සතු බල ප්‍රදේශයක් බැවින් මෙම ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාදී ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරිය සැලසුම් කමිටුවේ අනුමැතිය අනුව ව්‍යාපෘතියේ සියලුම අඩුපාඩු සම්පූර්ණ කිරීමෙන් පසු අනුකූලතා සහතිකය ලබාදීමේ පදනම මත බව දන්වමි. | සියළු පොදු පහසුකම් නිමකල පසු ඉඩම් වෙන්දේසි කිරීමට අනුකූලතා සහතික ලබා දී කොටස් විකිණීමට අනුමැතිය ලබාදිය යුතු වේ. |
| (ආ) | ඉඩම් කට්ටි කිරීමේ දී සැලැස්මක් අනුමත කර ගැනීමකින් තොරව කහටපිටිය මානෙල්වත්ත ඉඩමක් කට්ටිකර තිබුණි. ප්‍රධාන මාර්ගයක් ආසන්නයේ පිහිටි මෙම ඉඩම සංවර්ධනය කිරීම ප්‍රාදේශීය සභාවේ | සභාබල ප්‍රදේශය තුළ අනවසර ඉඩම් කට්ටි කිරීම සම්බන්ධව පරීක්ෂා කර නිත්‍යානුකූල අවසරය ලබාගෙන වෙන්දේසි කරන ලෙසට වෙන්දේසි ආයතන දැනුවත් කිරීම සඳහා තාක්ෂණ | අනුමැතිය ලබාගෙන ඉඩම් කට්ටි කිරීම කළ යුතු වේ. සියයට 01 ක විකුණුම් බදු ආදායම නිවැරදිව අයකර ගත යුතු වේ. |

| | |
|---|---|
| බලධාරීන්ගේ අවධානය යොමු නොවීම වගකීමකින් කටයුතු නොකිරීමක් බව නිරීක්ෂණය කෙරේ. 2022 අප්‍රේල් 06 පරීක්ෂණ දින වනවිට මෙම ඉඩමේ කට්ටි 08ක් විකුණා තිබුණි. මෙම ඉඩම් කට්ටි කිරීමෙන් සියයට 1 ක ආදායම ලෙස රු.2,066,568 ක පමණ මුදලක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | නිලධාරී වෙත උපදෙස් ලබාදී ඇති අතර අදාළ ආයතනය වෙත අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය අයදුම්පත්‍ර මෙම සභාව වෙත භාරදෙන ලෙස එම ආයතනය මේ වන විට දැනුවත් කර ඇත. |

## 3.2 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විහාරස්ථානයකට නව ඩෙස් හා පුටු ලබාගැනීම සඳහා රු.200,000ක චෙක්පතක් 2021 අගෝස්තු මාසයේ දී ලබාදී තිබුණද 2022 අප්‍රේල් 07 දින සිදුකරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී දහම් පාසල සඳහා මෙම ඩෙස් පුටු ලබාගෙන නොතිබුණ අතර, පරණ ඩෙස් හා පුටු දහම් පාසලේ තිබූ බව නිරීක්ෂණය විය. | විහාරස්ථානයේ දායක සභාව විසින් 2021/02/02 වන දින දහම් පාසලට ඩෙස් පුටු සාදා ගැනීම සඳහා ආධාර මුදලක් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම 2021.02.02 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්තිමය කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රු.200,000 ක ආධාර මුදලක් ආණ්ඩුකාර අනුමැතිය යටතේ ලබා දීමට තීරණය කර ඇත . | චෙක්පත් නිකුත් කලද ඩෙස් පුටු මිලට ගෙන නොමැත. අදාල කාර්යය ඉටුවූ බවට පසු විපරමක් සිදු කළ යුතු වේ. |